3 වන පිටෙන්

මිනිහාට තැනක් නැහැ කිය කියා අඬපු එක. පස්සෙ මේ හාදයා පළාතක ඉංගිරිසි විෂය භාරව වැඩ බලන තනතුරකට ගිහින් ඒක කෑවා.

මේ ළඟදි දවසක් පරිවර්තන අතානාත්තුවක ගනුදෙනුවක බේරාගන්න මහරගම පැත්තේ යන ගමන් ගුරු විද්‍යාල පාර අයින දිගේ ගියා. එතකොට මට මතක් වුණා මෙතනින් දෙන සහතිකේ තාම ගත්තෙ නැහැ නේ ද කියලා. නිකම් දෙන එකනේ. ඒ නිසා ගුරු විද්‍යාලයට ගොඩ වෙලා ඒකත් ඉල්ලාගෙන ආවා. දැන් ගුරු විද්‍යාලය පුස් කාපු, පරණ පාන් ගෙඩියක් වගේ. ගුරු විද්‍යාලවලින් දෙන දැනුමත් ඉතින් ඒ වගේ තමයි.

***<u>හැබැයි ඉතින් ඔය විදුහල්පතිවරුන්ට සීරුවෙන් ඉන්න එහෙම පුහුණු කරන එක නරක දෙයක් නෙමෙයි. මොකද, ඔය කොඳු නාරටි හැම තිස්සේ ම නැමිලා නේ තියෙන්නේ. මට බය ඔය කර්නල් විදුහල්පතිලා යුනිෆෝම් එහෙම ඇඳගෙන පාසලේ ඉන්නකොට ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෙනෙකු එහෙම ආවොත් දඩාං ගාලා සැලියුට් ගහයි ද කියලායි.</u>***

ගුරු විද්‍යාලයට යන්නේ ඉතින් ඔය විශ්ව විද්‍යාලයට යන්න බැරි වුණ අයනේ. හැබැයි ඉතින් ඇතැමෙක් ගුරු විද්‍යාලයට යනකොට ගුරු වෘත්තියේත් අවුරුදු ගණනක් ඉඳලා, කසාද බැඳලා, ළමයි*බමයි ලැබිලා, ඇට්ටකුණා වෙලා.

ඒ වුණාට ගුරු විද්‍යාලයට ගියාම සමහරුන්ට අර සැබෑ කර ගන්න බැරි වුණ කැම්පස් හීනය මතක් වෙනවා. මම ගුරු විද්‍යාලෙ යනකොටත් පුත්තලම් බූරුවෝ දෙන්නෙකුගේ විතර වයස. ඒ වුණාට අපට කලින් බැච් එකේ හිටපු ඞඅයියලාඞ අපට කිව්වෙ ඞමල්ලිලාඞ කියලා. ඒ කට්ටිය අපට ඞරැග්ඞ වගේකුත් කළා. ශිෂ්‍ය සංගමේ සභාපති වුණ එක ඞඅයියාඞ කෙනෙක් අපට කිව්වා ඞඅඩෝ තොපි ශිෂ්‍ය ව්‍යාපාරය පාවා දෙන්න එපාඞ කියලා. මං කල්පනා කළේ එතකොට ගුරු ව්‍යාපාරයට මොකද කරන්නේ කියලා.

ඉතින් ගුරු විද්‍යාලේ හිටපු මේ කාලේ අවුරුදු පතා එහි ක්‍රීඩා උත්සවයක් තිබුණා. මමත් ඒකෙ මැරතන් එක දුවලා අන්තිමයාට ඉවර කළා. මේ ස්පෝට්මීට් කාලෙට අර ඇට්ටකුණා වෙච්ච ගුරුවරුත් ළමයි වගේ කකුල් බැන්ඩේජ් කරගෙන බොරුවට අද්ද අද්දා ඇවිදිනවා, තමන් ස්පෝට්ස්මන්ලා ය කියා පෙන්වන්න.

විදුහල්පති මහත්තුරුන්ටත් මං හිතන්නේ කර්නල් පට්ටම ඉහට ගහලා තිබෙන්නේ තමන් වැඩි දෙනෙක් පාසල්වල කරන භූමිකාවට එයින් නෛතික බලයක් ලැබෙන නිසා වෙන්න ඇති. පාසල්වලට කර්නල්ලා පත් කරන ක්‍රමය අනුව තව ටිකක් කල් යනකොට පන්සල් පල්ලිවලට බ්‍රිගේඩියර්ලා පත් වෙන්නත් ඉඩ තියෙනවා. මම නම් මේක මිලිටරිකරණයක් විදියට දකින්නේ නැහැ. මේක එක්තරා මිලිටරි ජෝක්කරණයක්.

පාසල්වල තිබෙනවා කැඩෙට් කෝ කියලා එකක්. මේක හරහා මාර දෙයක් වෙනවා. ගුරු වෘත්තියට නො ආවා නම් සාමාන්‍ය සෙබළු විදියට හැර වෙනත් ආකාරයකට හමුදාවට යන්න බැරි ඇතැම් පිරිසකට මේ හරහා තරු ලැබෙනවා. ඒකෙන් ඒගොල්ලෝ මාර සතුටක් ලබනවා. පදවියේ ඉන්න කාලේ අපේ එක්තරා යාලුවෙක් මෙහෙම තනතුරකට පත් වුණා. ඔහුට තාත්තා ගෙදරින් ලියුම් එව්වේ "2 ලූති අහවලා" කියලා. යුද්දෙ උත්සන්න වෙනකොට මේ කට්ටියට සැබෑ ම හමුදාවට එක් වෙන්න කියලා බලපෑම් තිබුණා. ඒ නිසා අපේ යාලුවා තරුව එපා කියලා අයින් වුණා. දැන් යුද්දේ නැති නිසා මේ කට්ටියට හොඳයි. පණ වගේ ආරක්ෂා කරන එක ම එක යුනිෆෝම් එක ඇඳගෙන ඉඳ හිට දවසක පාසලේ ඇවිදින්නේ හරි ආඩම්බරෙන්. පවි(

සන්නස Cartoon by PK




PK ගේ කාටුන් රසවිඳින්නට දිනපතා
www.sannasa.net අඩවියට ගොඩවන්න

එක අතකට වත්මන් විදුහල්පති භූමිකාවට නම් මේ හමුදා තනතුරු ආභරණයක්. ඉස්සර විදුහල්පතිවරු පාසල වටේ යනකොට කිසියම් පංතියක ගුරුවරයෙකු නැතිනම් විදුහල්පතිවරයා ඒ පංතියට ගිහින් ඒ විෂය හෝ වෙනත් ඵලදායී දෙයක් උගන්වනවා. දැන් ඉතින් කරන්නේ ගිහින් කොල්ලන්ට තඩි ගහන එකනේ. ඒකට ඔය වගේ පුහුණුවක් නරක නැහැ. අද කාලේ ඇතැම් විදුහල්පතිවරු හිතන්නේ ළමයි කියන්නේ ඉස්කෝලෙන් ගහලා පැන්නිය යුතු ජාතියක් කියලා නේ.

හැබැයි ඉතින් ඔය විදුහල්පතිවරුන්ට සීරුවෙන් ඉන්න එහෙම පුහුණු කරන එක නරක දෙයක් නෙමෙයි. මොකද, ඔය කොඳු නාරටි හැම තිස්සේ ම නැමිලා නේ තියෙන්නේ. මට බය ඔය කර්නල් විදුහල්පතිලා යුනිෆෝම් එහෙම ඇඳගෙන පාසලේ ඉන්නකොට ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෙනෙකු එහෙම ආවොත් දඩාං ගාලා සැලියුට් ගහයි ද කියලායි.

හැබැයි, මම නම් ඕකේ හොඳ පැත්තකුත් දකිනවා. මට එහෙම ඔය වගේ තනතුරක් ලැබුණොත් මම නම් ඒක පාවිච්චි කරලා පැන්ෂන් ගියාට පස්සේ සිකියුරිටි කොම්පැනියක රස්සාවක් හොයා ගන්නවා. මොකද, පැන්ෂන් ගියත් අපි ඉතින් තව අවුරුදු හතරක් පහක්වත් මොනවා හරි කරන්න එපායැ.

www.w3lanka.com

